# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. *පංතිය - 13
   *විෂය - ව්‍යාපාර සංඛ්‍යානය
   *අදාළ සතිය - ඔක්තොම්බර් 1

2. පාඩම හෝ ඒකකය - 7. ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.
   7.9 සංගහන දෙකක මධ්‍යනායන්ගේ අන්තරය සඳහා විශ්‍රම්භ ප්‍රාන්තර භාවිත කරයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1. සංගහන දෙකක මධ්‍යනාය අතර වෙනස ඇස්තමේන්තු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ සොයා බලන්න.
   2.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   3. සංයුක්ත (කිටු කළ) විචලතාව පිළිබඳව පොතපතින් කරුණු රැස් කරගන්න.
   4. මධ්‍ය සීමා ප්‍රමේය පිළිබඳ වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view.php?id=21455

   2. ඊ නැණපියස -

      https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=28392

   3. ගුරු ගෙදර - නැත
   4. වෙනත් - යූ ටියුබ් - නැත

   5. අතිරේක පොත්/සඟරා -

6.මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -

1. සංගහන දෙකක මධ්‍යන්‍ය අතර වෙනස ඇස්තමේන්තු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
2. විචලතාව දන්නා ප්‍රමත සංගහන දෙකක මධ්‍යන්‍යයන්ගේ අන්තරය සඳහා විශ්‍රම්භ ප්‍රාන්තර ගොඩනගයි.
3. විචලතාව දන්නා ප්‍රමත නොවන සංගහන දෙකක මධ්‍යන්‍යයන්ගේ අන්තරය සඳහා විශ්‍රම්භ සීමා ගණනය කර විවරණය කරයි.
4. සංගහන විචලතා නොදන්නා නමුත් විචලතා සමාන අවස්ථාවක නියැදි විචලතා භාවිතයෙන් (පොදු) සංයුක්ත විචලතාව ලබා ගනියි.
5. විචලතාව නොදන්නා ප්‍රමත නොවන සංගහන දෙකක මධ්‍යන්‍යන්ගේ අන්තරය සඳහා මධ්‍ය සීමා ප්‍රමේය භාවිතයෙන් විශ්‍රම්භ ප්‍රාන්තර ගොඩනගයි.

7.තක්සේරුව හා ඇගයීම-

තොග වෙළෙන්දෙක් A හා B නිෂ්පාදන ආයතන දෙකෙන් එක්තරා නිෂ්පාදිතයක් මිලට ගනී.එම නිෂ්පාදන ආයතන දෙකෙන් 100 බැගින් වූ නියැදි ලබා ගත් විට එම නිෂ්පාදිතයේ මධ්‍යන්‍ය බර පිළිවෙලින් 110g හා 98gක් ලෙස ලැබුණි.තොග වෙළෙන්දාට 95%ක විශ්වාසයෙන් යුතුව සංගහනවල බරෙහි මධ්‍යන්‍ය අතර වෙනස සෙවීමට අවශ්‍ය ව ඇත.

1. A හා B නිෂ්පාදිතවල බරෙහි සංගහන ව්‍යාප්ති දන්නේද?
2. A හා B නිෂ්පාදිතවල බරෙහි වෙනසේ නියැදුම් ව්‍යාප්තිය කුමක්ද?
3. ඒ සඳහා යොදා ගත් උපකල්පන මොනවාද?

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -